වි. සුතේයෙව්



මීයා
හා
පැන්සලය

වී. සුතේයෙව්

මීයා හා පැන්සලය



අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

Kanol

මීයා හා පැන්සලය

කතාව සහ චිත්‍ර
වි. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ


නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-40-9

ප්‍රකාශනය
කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
යස ඉසුරු ප්‍රින්ටර්ස්

ප්‍රථම මුද්‍රණය 2013



වෝවාට පැන්සලයක් තිබුණා. ඔහු පැන්සලේට බොහොම ආදරෙයි. වෝවා රූප ඇඳීමට බොහොම ආසා ඇති ළමයෙක්. වෝවාට වුවමනා රූප ඔහුගේ පැන්සලය බොහොම හොඳින් අඳිනවා.



රෑ වෝවා නිදා හිටියා. එතකොට කෑම හොයා ගිය කුඩා මීයෙක් වෝවාගේ මේසයට නැංගා. එහි වෝවාගේ පැන්සලය තිබෙනවා මීයා දැක්කා.


"මේක මට හොඳයි" කියලා පැන්සලය ඩැහැගෙන මීයා ගුලට වැදුනා.

"අනේ මා අතඇරින්න! මගෙන් ඔබට ඇති වැඩේ මොකක් ද? මම ලී කෑල්ලක්, කෑමක් නොවෙයි" පැන්සලය මීයාට කන්නලව් කරන්නට පටන් ගත්තා.




"මගේ දත් උල් කරගන්න මොනව හරි නිතර හපන්න ඕනෑ. දැන් මට උඹ හපා කන්න පුළුවනි. මෙන්න හපා කනවා" කියල මීයා පැන්සලය තදින් හැපුවා.






"අනේ මට හිරිහැර කරන්න එපා! මට තව එකම එක රූපයක් අඳින්න ඉඩ දෙන්න. ඊට පස්සෙ ඔබට ඕනෑ දෙයක් කරන්න" පැන්සලය මෙසේ කන්නලව් කළා.

"හොඳයි උඹට ඕනෑ දෙයක් ඇඳපන්. ඊට පස්සෙ උඹ කුඩා කෑලිවලට හපකරල දානවා" මීයා පිළිතුරු දුන්නා.




කනගාටුවෙන් සුසුම් හෙළලා පැන්සලය ලොකු රවුමක් ඇන්දා. එවිට මීයා ඇහුවා "මේක කේප්ප් බෝලයක් ද? කියල.



"හොඳයි! එහෙම හිතා ගනිමුකො" කියල පැන්සලය ලොකු රවුම ඇතුළේ කුඩා රවුම් තුනක් ඇන්දා. "හා! හා! කේප්ප් බෝලයක් ම තමයි. අන්න කේප්ප් බෝලෙ හිල්!" මීයා කිව්වා.


"හොඳයි ඒවාට කේප්ප් බෝලේ හිල්ය කියමුකො!" පැන්සල මෙහෙම කියල පළමු රවුමට පහළින් තවත් රවුමක් ඇන්දා.




"මේක ඇපල් ගෙඩියක් නේ ද?" මීයා ඇහුවා.

"හොඳයි ඒක ඇපල් ගෙඩියක් තමයි," කියල දෙවනි ලොකු රවුම ළඟින් දිග හැඩේ යමක් අඳින්න පටන් ගත්තා.


"හා! හා! මම දන්නවා, මේවා කෙසෙල් ගෙඩිනේ! දකිනකොටම කන්න හිතෙනවා" මීයා කිව්වා.



පැන්සලය පළමු රවුමට ඉහළින් කුඩා මුළු දෙකක් අඳින්න පටන් ගත්තා. "අපොයි! අපොයි! දැන්නම් බළලෙක් වගෙයි. ඔය ඇති! ඔය ඇති! නවත්වාපන්" මීයා කෑ ගැහුවා.




නමුත් පැන්සලය ඉහළ රවුමේ දිග රැවුල් ගසුත් කටකුත් ඇන්දා.



"මූ නම් බළලෙක් ම තමයි! මාව බේරා ගනිල්ලා!"යි කෑ ගහලා මීයා පණ බයේ පැන දිව්වා.


මීයා දුවලා තම ගුලට වැදුනා. ඊට පස්සේ හිස එයින් පිටතට දැම්මේ නෑ.







පැන්සලය තවම වෝවා ළඟ ය. දැන් එය පැන්සල් කොටයකි.


මීයන් බිය ගැන්වීමට හැකි බළලෙක් ඇඳීමට දැන් ඔබටත් පුළුවන්දැයි බලන්න.























Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-08-9
Rs. 70/-
9"789551"979089"